**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

**DCS/DG/PRESS** **TEL:011-2877959** **FAX:011-2147447** **2016 මාර්තු 24**

# මාධ්‍ය නිවේදනය

# ට්විටර් ගිණුම් මගින් යාවත්කාලීන කරන ලද සංඛ්‍යාති

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් දත්ත භාවිත කරන්නන් විශාල සංඛ්‍යාවක් ආවරණය වන පරිදි ශිෂ්‍යයන්, ප්‍රතිපත්ති සම්පාදකයන් ,පර්යේෂකයන් සහ අන්තර්ජාතික ආයතන ආදිය වෙත සමාජ ආර්ථික සහ ප්‍රජාවිද්‍යාත්මක සංඛ්‍යාති, සපයනු ලබයි. එසේම දෙපාර්තමේන්තුව විසින් විවිධ මූලයන් යටතේ එනම් සංගණන, සමීක්ෂණ සහ පරිපාලනමය වාර්තා වශයෙන් සංඛ්‍යාති පිළියෙල කෙරේ.

වර්තමානයේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන සංඛ්‍යාති සහ විවිධ වූ සංඛ්‍යානමය වාර්තාවන් නිකුත් කිරීම සඳහා මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය ප්‍රකාශන, නිල වෙබ් අඩවිය සහ ජන මාධ්‍යන් භාවිතා කරනු ලබයි. එසේම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සතු සංඛ්‍යාති යාවත්කාලීන කර නිකුත් කිරීම සඳහා සමාජ මාධ්‍යයන් යොදා ගැනීම ආරම්භ කර ඇති බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරයි. සංඛ්‍යාති නිකුත් කිරීමේ ක්ෂණික යාවත්කාලීන කිරීම් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ට්විටර් ගිණුම @LankaSTAT හා සම්බන්ධ වී ලබා ගැනීමට මේ අනුව දත්ත පරිහරණය කරන්නන්ට අවස්ථාව ලැබේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිළ දර්ශකය (NCPI) පිළිබඳව 2016 පෙබරවාරි මාසය ආවරණය වන පරිදි යාවත්කාලීන කරන ලද තොරතුරු 2016 මාර්තු 21 වන දින නිකුත් කිරීම සමඟින් මෙම ට්විටර් ගිණුම ආරම්භ කර ඇත.

එසේම දෙපාර්තමේන්තුව විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් මාධ්‍ය නිවේදන නිකුත් කිරීමටද කටයුතු යොදා ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදන ජනමාධ්‍යවේදීන් ඇතුළු දත්ත භාවිත කරන්නන්ට දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ “මාධ්‍ය නිවේදන” උපශීර්ෂය යටතේ පහසුවෙන් ලබා ගත හැකිය.

දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය - www.statistics.gov.lk

ආචාර්ය ඒ.ජේ.සතරසිංහ

අධ්‍යක්ෂ ජනරාල්,

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව